<u>අතුරු තහනම් නියෝගය පිළිබඳ දැන්වීම.</u>

<u>කොළඹ දිසා අධිකරණයේදී ය.</u>

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයේ නිහාල් ශ්‍රී අමරසේකර.

<u>පැමිණිලිකරු.</u>

| | | |
|---|---|---|
| **නඩු අංකය** | **: 3155/විශේෂ** | **එදිරිව** |
| **ස්වභාවය** | **: විශේෂ** | |
| **වටිනාකම** | **: රු.100,000/-** | |
| **කාර්ය පටිපාටිය** | **: සාමාන්‍ය** | |

1. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, චියෝඩා-කු, මිටමචි 1-චෝම් හි 2-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන සහ කොළඹ 02, චොක්ෂෝල් වීදියේ, අංක.315, දරණ ස්ථානයේ, ශ්‍රී ලංකාවේ සම්බන්ධීකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්.

2. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, ෂින්ජුකු-කු, නිෂි-ෂින්ජුකු 1-චෝම් හි 25-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන හා මහරගම, හයිලෙවල් පාරේ, අංක.65 දරණ ස්ථානයේ ශ්‍රී ලංකාවේ සම්බන්ධීකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන තායිසෙ කෝපරේෂන්.

3. ජපනයේ නීති යටතේ නිසි ලෙස සංවිධානය වී තිබෙන සංස්ථාවක් වන සහ ජපානයේ ටෝකියෝ නුවර, මිනාටෝ-කු,

අටාගෝ 1-2-2, මොරි ගොඩනැගිල්ලේ අංක.9 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන ගෘහ නිර්මාණ ශිල්පීන් සහ සැලසුම්කරුවන් වන කන්තො කිකාකු සෙක්කිෂා යෝෂෝ ෂිබාටා ඇන්ඩ් ඇසෝෂියේට්ස්.

4. කලික් ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් වශයෙන් හැඳින් වූ සහ කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්.

5. කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයෙහි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් ලයනල් පෙරේරා.

6. කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක.51/3 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ප්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්.

7. කොළඹ 07, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවතේ, අංක.23/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි.

8. කොළඹ 06, හැව්ලොක් පාරේ, අංක.696/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ දොන් පීටර් සෙවරිනස් පෙරේරා.

9. ජාපනයේ, කසගාව, චිගසාකි, ෆුජිමිචෝ, 6-38 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කෂුටාකා කොබෝයි.

10. කොළඹ 06, රාමක්‍රිෂ්ණා මාවතේ, අංක.4 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කනපතිපිල්ලේ ශන්මුගලිංගම්.

11. දැනට කොළඹ 02, චොක්ෂෝල් වීදියේ, අංක.315 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කොජි ඉතෝ.

විත්තිකරුවෝ.

ඉහත නම් සඳහන් 1 වන, 2 වන, 3 වන සහ 4 වන විත්තිකාර සමාගම් වෙතය.

ඉහත නම සඳහන් පැමිණිලිකරුගේ දිවුරුම් පතේ සහ 'පී1' සිට 'පී54' දක්වා ලකුණු කළ ලියකියවිලිවල පිටපත් සමඟ මීට අමුණා ඇති 1990 සැප්තැම්බර් මස 13 දිනැති පැමිණිලකරුගේ පැමිණිලි පතේ (උ) සහ (ඌ) ආයාචනා ප්‍රකාර අතුරු තහනම් නියෝග සඳහා වන ඉල්ලීමක් පැමිණිලිකරු කර ඇති හෙයින්,

1990 සැප්තැම්බර් මස 17 සහ 18 දිනයන්හි මෙම කාරණය කොළඹ දිසා විනිසුරු තැන්පත් පී.විජයරත්න මැතිතුමා ඉදිරිපිට පැමිණිලිකරු වෙනුවෙන් නීතිඥ ද සිල්වා සහ පෙරේරා ව්‍යාපාරයේ උපදෙස් පිට නීතිඥ ඒ.ඒ.ඇම්.ඉලියාස් මහතා, නීතිඥ ඇස්.ශ්‍රීකාන්තන් මහතා සහ ජනාධිපති නීතිඥ කේ.කනග්-ඊස්වරන් මහතා සමඟ රාජ නීතිඥ පී.නවරත්න රාජා මහතා පෙනී සිටියදී ගනු ලැබූ අතර, එහි පැමිණිලිපත, දිවුරුම් පත සහ 'පී1' සිට 'පී54' දක්වා ලකුණු කළ ලියකියවිලි සළකා බලා, තවද, අතුරු තහනම් නියෝගය සඳහා වන එකී ඉල්ලීම තහවුරු කිරීමේ දී රාජ නීතිඥ මහතා ඉදිරිපත් කළ කරුණුවලට සවන් දී මෙම අධිකරණය, වෙනත් දේ අතර

පැමිණිලිකරුට පැමිණිලිපතේ එකී (උ) සහ (ඌ) ආයාචනා පරිදි, වාරණ නියෝග ලබා දෙමින් සහ අතුරු තහනම් නියෝග සඳහා වන එකී ඉල්ලීම පිළිබඳ දැන්වීම ඔබ සමාගම වෙත නිකුත් කිරීමට නියම කරමින් නියෝග කළ හෙයින් ද,

එමනිසා 1990 නොවැම්බර් මස 12 වන දින පෙරවරු 9.00 ට මෙම අධිකරණයේ පෙනී සිට පැමිණිලිපතේ එකී (උ)/(ඌ) ආයාචනයේ අයැද පරිදි අතුරු තහනම් නියෝගය සඳහා වන පැමිණිලිකරුගේ එකී අතුරු තහනම් නියෝග සඳහා වන ඉල්ලීමට ඉඩ නොදිය යුත්තේ මන් ද යනුවෙන්, යම් හේතූන් ඉදිරිපත් කිරීමට ඇත්නම්, එම හේතූන් ඉදිරිපත් කරන ලෙසට ඔබ සමාගමට මෙයින් නියම කරනු ලබේ.

1990 ක්වූ සැප්තැම්බර් මස 20 දිනදී ය.

අධිකරණයේ අණ පරිදි,

*අත්සන් කළේ :- ඩී.ලියනගේ*

රෙජිස්ට්‍රාර්වරයා.

අප විසින් සකස් කරන ලදී.

පැමිණිලිකරුගේ නීතිඥවරුන්.

ඉහත සඳහන් වනුයේ කොළඹ දිසා අධිකරණයේ අංක.3155 විශේෂ නඩුවේ 1 වැනි, 2 වැනි, 3 වැනි සහ 4 වැනි විත්තිකාර සමාගම් වෙත නිකුත් කළ අතුරු තහනම් නියෝගය පිළිබඳ දැන්වීමේ සත්‍ය පිටපතක් බව මෙයින් සහතික කරමි.
(පිටු 01 සිට 03 දක්වා).

රෙජිස්ට්‍රාර්,
දිසා අධිකරණය,
කොළඹ.

S/18-308954

Checked by 8

